- දුවේ, පුතේ වැඩිහිටියන් සමග එකතු වී බුද්ධාගම පොතේ 16 පාඩම කියවන්න සූදානම් වෙමු.

"අපේ පන්සලේ ශ්‍රම දානය" පාඩමේ නම දැන් ශබ්ද නගා පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

1. **ක්‍රියාකාරකම් -** දුවේ, පුතේ පන්සල් වත්තේ ශ්‍රමදානයට ගෙන ආ උපකරණ වල රූප සටහන් බුද්ධාගම පොතේ අඳිමුද ? ලස්සනට ඇඳලා පාට කරන්න බලන්න.

2. **ක්‍රියාකාරකම් -** දුවල පුතාලට තේරුම් ගියාද පන්සල් වත්තේ ශ්‍රමදානයට ගුරුතුමා කණ්ඩායම් බෙදපු ආකාරය හැමොටම වැඩ බෙදා දුන්නා නේද ?
ඒ වැඩ බෙදා දුන්න ආකාරය සොයා ගැලපෙන ලෙස ඉරකින් යා කරන්න පුළුවන්ද බලමු.

1. පන්සල් වත්තට යනපාර දෙපැත්ත හා ගස් වල අතු පාහින වැඩ	අම්මලාට
2. පන්සල් වත්ත අතු ගා පිරිසිදු කිරීම	තාත්තලාට
3. මල් ගස් වල අතු කැපීම, පස් බුරුල් කිරීම, වල් පැලෑටි ගැලවීම, ගොම පොහොර දැමීම, විහාරය හා බෝ මළුව ඇමදීම	රන්දිගේ කණ්ඩායමට
4. මල් ආසන සේදීම හා මල් වට්ටි ගිලන්පස භාජන සේදීම	තරණි දුවගේ කණ්ඩායමට
5. මකුළු දැල් පිස දමා බිම සොදා පිරිසිදු කිරීම	දිනිති දුවගේ අම්මා ඇතුළු කණ්ඩායමට

බෙහොම හොඳට යා කරා නේද ?

දුවට පුතාට බුදු සරණයි ! ඊළඟ පාඩමින් හමුවෙමු.